රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 15/94

මගේ අංකය : III /0266/2/68/(පොදු)එල්/එච්ජ්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 අප්‍රියෙල් මස 26 දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

## වැටුප් ණය/අත්තිකාරම් - **XXIV** වැනි පරිච්ඡේදය
## <u>ආයතන සංග්‍රහය.</u>

**1991.11.20** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේ‘ අංක. **54/91** හා **1992.01.31** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.**6/92** කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

**02.** මෙම චක්‍රලේ‘ මගින් රාජ්‍ය නිලධාරීන්ට පහත සඳහන් කරුණු දෙක සඳහා ණය දීමට විධිවිධාන සලසා ඇත.

I. නිවසක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපලක් මිලදී ගැනීමට.
II. නිවසක් ඉදිකිරීම/වැඩ අවසන් කිරීම සඳහා.

**03.** ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදය II වගන්තිය අනුව නිවසක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපලක් අත් කර ගැනීමට වසර දෙකක උපරිමයට යටත්ව වැටුප් ණය ලබා ගත් නිලධාරීන්ට, එම ණය ගෙවා අවසන් නොවුවද නිවසක් ඉදිකිරීම/වැඩ අවසන් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.**6/92** අනුව ණය ලැබීමට හිමිකම් ඇති වසර **05** උපරිමයෙන් ඉතිරි වසර ප්‍රමාණය සඳහා වන වැටුප, ණයක් වශයෙන් ලබා ගත හැකි බවට දැන් තීරණය කර තිබේ.

**04.** කෙසේ වුවද XXIV වන පරිච්ඡේදය II වගන්තිය අනුව ණය ලබා ගෙන ඇති නිලධාරීන්ට නැවත ඉතිරි ණය ලබා ගත හැක්කේ කලින් ලබා ගන්නා ලද ණය මුදලින් මිලදී ගත් ඉඩමේම නිවසක් ඉදිකිරීම/ඉදිකරන ලද නිවසක වැඩ අවසන් කිරීම සඳහා පමණකි. මෙම ණය මුදල වසර **05** ක ණයෙහි ඉතිරි කොටසක් වශයෙන් නොව, ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවක් අනුව වෙනම ණයක් ලෙස දිය හැකි අතර, ආපසු අයකර ගැනීමේදී ණය මුදල් දෙකම ඒකාබද්ධ කර හෝ වෙනම අයකර ගැනීම් කළ යුතුය.

**05.** නිවසක වැඩ අවසන් කිරීම සඳහා මෙම ණය දීමේදී, ඉදි කෙරෙන නිවස සඳහා පිලිගෙන ඇති වැඩ ඇස්තමේන්තුවේ ඇතුලත්ව ඇති හා එයින් දැනට වැඩ අවසන් කර නොමැති වැඩ විෂයයන් සඳහා පමණක් ණය නිකුත් කළ යුතුය.

**06.** **1992.01.31** දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.**6/92** හි සඳහන් සැලසුම් හා ඇස්තමේන්තු, වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකුගෙන් හෝ වරලත් සිවිල් ඉංජිනේරුවෙකුගෙන් හෝ ලබා ගත හැකිය.

07. කලත්‍රයාට අයත් ඉඩමක, නිවසක් ඉදිකිරීම/ඉදිකරනු ලබන නිවසක වැඩ අවසන් කිරීම සඳහා ණය මුදල් දෙනු නොලැබේ.

08. මෙහි ණය මුදල අනුමතක කිරීමේදී අත්තිකාරම් ගිණුමේ සීමාවන් නොඉක්මවීමට ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය.

09. මෙම චක්‍රලේ'ය නිකුත් කරන ලද්දේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/ (වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.